23 පිටෙන්

'ඒ කාලේ අපේ සම්මුතියක් තිබුණා චිත්‍රකතා අඳිනකොට අබාධිත පුද්ගලයන්ව උපහාසයට ලක් නොකළ යුතුයි කියලා. කාන්තා චිත්‍ර ඇඳීමේදී ශරීරයේ නිරාවරණය කර පෙන්විය යුතු ප්‍රමාණය ගැන එකඟතාවක් තිබුණා. කතාවේ හැටියට නිරුවත් රූපයක් පෙන්විය යුතු නම් ඒක ඇන්දේ ලිංගික ප්‍රදේශ වෙනත් විදිහකින් ආවරණය වෙන ආකාරයට. මිනිසුන් කපා කොටා ගන්නා අවස්ථා චිත්‍රයට නැගීමේදී බෙලි කැපී වෙන්වෙන ආකාරය වගේ චිත්‍ර ඇන්දේ නෑ. ඒ සිදුවීම වෙනත් විදිහකටයි ඇන්දේ. ඒ කාලේ ඇමරිකාවේ චිත්‍ර ශිල්පීන්ගේ සම්මුතියක් මුල්කරගෙනයි අපි එහෙම කළේ. පස්සේ පස්සේ ඒ තත්ත්වයන් වෙනස් වුණා. හැබැයි චිත්‍රකතා පත්තර කලාව වැටෙන්න එකම හේතුව වුණේ ඒක නෙවෙයි. රූපවාහිනිය වගේ සජීවී මාධ්‍ය ප්‍රචලිතවීමත් හේතුවුණා. එක පැත්තකින් එවා බහුල වෙද්දී අනෙක් පැත්තෙන් සමාජය වෙනස් වෙලා මිනිස්සු විවේකයක් නැති යාන්ත්‍රික පිරිසක් බවට පත්වුණා. චිත්‍රකතා පත්තරයක් බලන්න විවේකයක් තියෙන්න ඕනේ. රූපවාහිනිය එහෙම නෙවෙයි. කෑම කන ගමනුත් බලන්න පුළුවන්. අද වෙන කොට රූපවාහිනී සේවාවල විකාශනය වෙන මෙගා ටෙලි නාට්‍ය බවට පත්වෙලා තියෙන්නේ එදා චිත්‍රකතා පත්තරවල ගියපු කතා. මගේ කතා කීපයකුත් ඒ විදිහට ටෙලි නාට්‍ය බවට පත්වුණා. හැබැයි මම දකින විදිහට නම් හුගක් වෙලාවට මුල් චිත්‍රකතාවල සාර්ථකත්වය ටෙලි නාට්‍ය තුළ රදවාගන්න බැරිවුණා.'

වර්තමානයේ දේශපාලන කාටුන් කලාව අතිශය ජනප්‍රියත්වයක් උසුලයි. වෘත්තීය ජීවිතයේ ආරම්භක අවදියේ ජනක ද කාටුන් ඇඳීමේ නිරතවිය. පුද්ගලයන් උපහාසයට පමණක් නොව අපහාසයටද පත්කෙරෙන දේශපාලන කාටුන් සම්බන්ධයෙන් ජනකගේ ස්ථාවරය මෙසේය.

'දේශපාලකයන්ගේ දුර්වලතා කාටුන් මගින් විවේචනය කිරීම වෘත්තීය ආචාර ධර්ම පිළිබඳ ගැටළුවක් ඇතිකරවන්නේ නෑ. මොකද ඒවා නිවැරදි කරගන්න පුළුවන් වැරදි. නිවැරදි විය යුතුයි කියලා ජනතාව විශ්වාස කරන වැරදි. වරදක් වෙන්නේ කාටුන් ශිල්පියෙක් කිසියම් පුද්ගලයෙකුගේ නිවැරදි කරගත නොහැකි දුර්වලතාවක්, අඩුපාඩුවක් හුවා දක්වමින් කාටුන් අඳිනවා නම් විතරයි. ඇහැක වපරයක් තියන කෙනෙක්ගේ ඒ අඩුපාඩුව හුවා දක්වමින් කාටුන් අඳිනවා නම් ඒක වැරදියි. ඒක ඒ පුද්ගලයාට නිවැරදි කරගන්න බැරි ආකාරයේ වරදක්. නමුත් දේශපාලකයන් විවේචනයට ලක්වෙන්නේ ඒ අයට නිවැරදිකරන්ගන්න පුලුවන් ආකාරයේ දුර්වලතාවයන් නිසයි'

බොහෝ කලා විෂයයන් සම්බන්ධයෙන් විවිධ මට්ටමේ සංවාද, විසංවාද, රසාස්වාද ආදිය රසික සමාජයේ තිබුණද චිත්‍ර කලාව සම්බන්දයෙන් එවැනි තත්ත්වයක් නොතිබීමේ අඩුව පිළිබඳ ජනකගේ අදහස් කවරේද ?

'එතන යම් අඩුවක් තියනවා තමයි. චිත්‍රයක් රසවිඳින්නත් යම් මගපෙන්වීමක් තිබීම වැදගත් දෙයක්. නමුත් අපේ රටේ චිත්‍ර සම්බන්ධයෙන් රසාස්වාදයක්වත්, විචාරයක්වත් නෑ. එක පැත්තකින් අපිත් ඒකට වගකිව යුතුයි කියල මට හිතෙනවා. මොකද ඒ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් විදිහට අපි ඒ දේවල්වලට මැදිහත් විය යුතුයි. හැබැයි ඒ මැදිහත්වීම කරන්නේ කොහොමද කියන එක ගැටළුකාරීයි. මම මගේ චිත්‍ර ගැන කතා කරන්න ගියොත් ඒක එක පැත්තකින් තමන්ගෙම පිට කසා ගැනීමක් බවට පත්වෙනවා. මගේ චිත්‍ර ගැන කතා නොකර අනෙක් අයගේ ඒවා ගැන කතා කරන්න ගියොත් එතනදි මතුවෙන්නේ තවත් ප්‍රශ්ණයක්. ඒ අතරේ අවිවේකී බව. කොහොම වුණත් මම හිතන්නේ චිත්‍ර රසවිඳීම සම්බන්ධයෙන් රසිකයන් අතරින් විචාර විවේචන රසාස්වාද වගේ දේවල් මතුවෙනවා නම් ඒක වඩා හොඳයි කියලා මට හිතෙනවා.

සිය නිර්මාණකරණය සම්බන්ධයෙන් කතා කරන ජනක පවසන්නේ තමන් රසිකයන්ගේ විවේචන සම්බන්ධයෙන් බෙහෙවින් සංවේදී වන බවය. කෙනෙක් සිය සිතුවමක යම් අඩුවක් පෙන්වා දුන්විට නොපැකිළව ඒ ගැන අවධානය යොමුකර එය සංස්කරණය කරන්නට තමන් කිසිදු විටෙක නොපැකිලෙන බව හේ පවසයි.

'කලාකරුවෙක් සමාජයට දිය යුත්තේ සමාජය ඉල්ලන දේ නෙවෙයි කියන එක මම පිළිගන්නවා. ඇත්තටම මම රසිකයන්ගේ විවේචන වලට දක්වන ප්‍රතිචාර ඉල්ලන දේ දීමක් නොවෙයි. මම දෙන දේ රසිකයා සෑහීමකට පත්වෙන විදිහට දීමක්. අපි අඳින්නේ වෙනත් පිරිසක් වෙනුවෙන් නිසා ඒ අය තෘප්තිමත් විදිහට අපේ කටයුත්ත කිරීමේ වගකීමක් අපිට තියනවා. මම කරන්නේ ඒ දේ මිස ඉල්ලුමට සැපයුම නෙවෙයි.'

මෘදු හදවතකින් හැසිරවෙන රළු සුරතක් ලෙස මෙහි මුලින්ම මා ජනකගේ තෙළිතුඩ හැඳින්වූයේ ඔහු පිළිබඳ බොහෝ දෙනෙකු නොදන්නා කාරණාවක් හේතුවෙනි. ජනක තරුණ අවධියේ දක්ෂ බොක්සිං ක්‍රීඩකයෙකුවීම එම කරුණයි.

'ඒ කාලේ මම බොක්සිං ක්‍රීඩාවට යොමුවුණේ විශේෂයෙන්ම ශරීර සෞඛ්‍ය පැත්තෙන් කල්පනා කරලයි. පත්තර රස්සාව කියන්නේ ක්‍රීඩා කරන්න තරම් විවේකයක් තියන රස්සාවක් නෙවෙයිනේ. රෑට තමයි විවේකයක් ලැබෙන්නේ. ඒ විවේකයේදී කරන්න පුළුවන් ක්‍රීඩාවක් විදිහට තිබුණේ බොක්සිං. ඒ නිසා මම ක්‍රීඩා සමාජයකට බැඳිලා බොක්සිං කළා. ක්‍රීඩා සංගම් අතර තරඟ ගණනාවක් දිනලා තියනවා. ඒ කාලේ මට තරඟ කරන්න ලැබුණේ හමුදාවල පොලිසියේ බොක්සිං ක්‍රීඩකයනුත් එක්ක. මම යුද හමුදාවෙයි නාවික හමුදාවෙයි ප්‍රතිවාදී තරඟකරුවන් පරද්දලා ජය අරගන තියනවා. ඒ කාලේ නාලන්දේ බොක්සිං තිබුණේ නෑ. මම මුලින්ම බොක්සිං ඉගෙන ගන්න ක්ලබ් එකට ගිය වෙලාවේ පුහුණුකරු මගෙන් ඇහුවා මොකද මේ කාලේ බොක්සිං ඉගෙන ගන්න හිතුනේ කාට හරි ගහන්නවත්ද කියලා. මට අයුක්තියේදී අසාධාරණයේදී තරහ ගියත් කිසිම වෙලාවක බොක්සිං ක්‍රීඩාවෙන් ඒවාට උත්තර හෙව්වේ නෑ. ඒවට විරුද්ධව සටන් කළේ වෙනත් විදිහකටයි'

චිත්‍ර ශිල්පියෙකු ලෙස වෘත්තීය ජීවිතය ආරම්භ කර කළක් කොළඹ ශාන්ත ජෝශප් විද්‍යාලයේ චිත්‍ර ගුරුවරයෙකු ලෙසද කටයුතු කළ ජනක අද වයෝවෘද තරුණ සිත්තරෙකු වුවද ඉසිඹු නොලැබ සිය නිර්මාණ කාර්යයේ නියැළී සිටියි. උපාලි පුවත්පත් ආයතනයේ ප්‍රධාන චිත්‍ර සංස්කාරකවරයා ලෙස තවමත් කටයුතු කරන ජනක රැකියාවෙන් විශ්‍රාම ලබන්නේ කවදාදැයි සමුගන්නා මොහොතේ මම විමසා සිටියෙමි.

'වයස අනුව නම් දැන් මම ඉන්න ඕනේ විශ්‍රාමිකව. ඒත් මේ වෘත්තියත් එක්ක මට විශ්‍රාම යාමක් ගැන හිතන්න බැරිවෙලයි තියෙන්නේ. අදටත් ලංකාවේ ඉහළින්ම ඉන්න චිත්‍ර ශිල්පීන් කීප දෙනා අතරට මාත් අයිතිවෙනවා. ඉතිං විවිධ නිර්මාණ සඳහා මගේ දායකත්වය හොයාගෙන එන පිරිස එදා වගේම අදත් එනවා. ඒ වගේම මේ කටයුත්තෙන් මම විශාල ආත්ම තෘප්තියකුත් ලබනවා. ඒ නිසා මම විශ්‍රාම යාමක් ගැන හිතන්නේ නෑ.' ජනක පැවසුවේය.

■




